සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 8 - 2019

නම : ............................................... ඉතිහාසය කාලය : පැය 02 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

## I කොටස

(01) අතීත වාරි ශිල්පීන් වැවේ ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම සඳහා ................................. නිර්මාණය කරන ලදී.
(සොරොව්ව, බිසෝ කොටුව, පිටවාන)

(02) දළදා මාළිගාවට චිත්තාකර්ෂණීය පත්තිරිප්පුව එක් කිරීමට දායක වූයේ ................................. රජතුමා ය.
(ශ්‍රී වික්‍රම රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ)

(03) පෙර අපරදිග වෙළඳාමේ දී වැදගත් වූ කොන්ස්තන්තිනෝපල් නම් වෙළඳ නගරය අල්ලා ගන්නා ලද්දේ ................................. ජාතිකයන් විසිනි.
(පෘතුගීසීන්, ස්පාඤ්ඤ, තුර්කි)

(04) පෘතුගීසි ජාතිකයෙකු වූ ................................. තම දේශ ගවේෂණ ව්‍යාපාරය මගින් ලෝකය ගෝලාකාර බව තහවුරු කළේ ය.
(පර්නැන්ඩෝකෝටෙස්, පර්ඩිනන්ඩ් මැගලන්, ක්‍රිස්ටෝපර් කොලොම්බස්)

(05) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ 8 වන වීර පරාක්‍රමබාහු රජතුමා ................................. රාජධානියේ පාලන කටයුතු මෙහෙයවනු ලැබී ය.
(යාපන, කෝට්ටේ, උඩරට)

- අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරි නම් '3' ලකුණ ද වැරදි නම් 'X' ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(06) වසභ රජතුමා අඹන් ගඟ හරහා වේල්ලක් බැඳ උතුරු ප්‍රදේශයට ජලය ලබා ගැනීමට ඇළහැර ඇළ කරවන ලදී. ( )

(07) යමසිංහ බණ්ඩාර පෘතුගීසීන් යටතේ බෞතිස්ම ලැබුවේ කොනප්පු බණ්ඩාර නමිනි. ( )

(08) යුරෝපයේ පුනරුදයට පෙර අවධියේ බොහෝ කලා නිර්මාණ බිහිවූයේ ආගමික අරමුණු මුදුන් පත් කර ගැනීමේ අරමුණින් ය. ( )

(09) යුරෝපා දේශගවේෂණ ව්‍යාපාරයේ දී සුබ පැතීමේ තුඩුව සොයාගැනීමේ ගෞරවය හිමි වූයේ පෘතුගීසි ජාතික වස්කෝදගාමාට ය. ( )

(10) කෝට්ටේ රාජධානිය කොටස් තුනකට කැඩීයාමට බලපෑ ලංකා ඉතිහාසයේ වැදගත් දේශපාලන සිදුවීම වූයේ විජයබා කොල්ලයයි. ( )

I අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) අතීතයේ දී ශ්‍රී ලංකාවේ බෙලෙක් භාණ්ඩ තාක්ෂණයේ යෙදුන ශිල්පීන් හඳුන්වා ඇත්තේ කුමන ආකාරයට ද?

1. කබර
2. තුලධර
3. තොපෂ
4. තඹර

(12) උඩරට රාජධානිය කෝට්ටේ ග්‍රහනයෙන් බේරා ගැනීමට හය වැනි පරාක්‍රමබාහුට එරෙහිව කැරලි ගැසූ තැනැත්තා කවුද?

1. ටිකිරි කුමරු
2. මහස්ථාන කුමරු
3. ජයවීර බණ්ඩාර
4. ජෝතිය සිටාණන්

(13) පහත සඳහන් විශ්ව විද්‍යාල අතරින් මධ්‍යතන යුගය අවසානයේ දී එංගලන්තයේ බිහි වූ විශ්ව විද්‍යාලයක් තෝරන්න.

1. පාදුවා
2. පැරිස්
3. කේම්බ්‍රිජ්
4. බොලොඤ්ඤා

(14) තම වෙළඳ සමාගමට අයත් වෙළඳ ගබඩා පොන්ඩිචෙරි, කරිකාල්, චන්දනගර් වැනි ස්ථානවල පිහිටුවා ගත් යුරෝපා ජාතිය පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. පෘතුගීසි
2. ප්‍රංශ ජාතීන්
3. ලන්දේසි
4. බ්‍රිතාන්‍යයන්

(15) රාජාවලියේ දැක්වෙන ආකාරයට පෙරදිග රටක දී පෘතුගීසීන් දරුණු ලෙස පරාජය ලැබූ සටන කුමක් ද?

1. මුල්ලේරියා සටන
2. දන්තුරේ සටන
2. රන්දෙනිවෙල සටන
4. බලන සටන

I අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර කුමක් දැයි ලියා දක්වන්න.

(16) පිළිම ගෙවල් නිර්මාණයේ දී ප්‍රධාන පිළිමය සැතපෙන ඉරියව්වෙන් නිර්මාණය කළේ ......................................... සම්ප්‍රදායට අයත් පිළිම ගෙවල් ය.

(17) ඉංග්‍රීසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන්ගෙන් අල්ලා ගත්තේ ......................................... රජුගේ කාලයේ ය.

(18) ග්‍රීක හා රෝම ගෘහ නිර්මාණ ශිල්පය පිළිඹිඹු කරන අපූර්වතම නිර්මාණය ලෙස ......................................... දේවස්ථානය හැඳින්විය හැක.

(19) ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය වූ ......................................... ගිනිකොණ දිග ආසියාවේ ජාවා දූපතේ පිහිටා ඇත.

(20) දොන් ජෙරනිමෝද අසවේදු හා කෝට්ටේ ජනප්‍රධානීන් එකතු වී එතෙක් පැවති පාලනය තව දුරටත් ගෙන යාමට ඇති කර ගත් එකඟතාවය ......................................... ගිවිසුමෙන් කියවේ.

(ලකුණු 20 x 2 = 40)

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.




(01) (i) පෘතුගීසි ජාතික බර්තොලමියු ඩයස් සොයා ගත් ප්‍රදේශය A අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද? (ලකුණු 2)

(ii) පෘතුගීසි ජාතික පර්ඩිනන්ඩ් මැගලන් ලෝකය වටා ගිය ගමනේ දී ස්වදේශිකයන් අතින් මරණයට පත් වූ දූපත් දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 2)




(iii) ලංකා සිතියමේ දක්වා ඇත්තේ 16 වන සියවසේ මුල් කාලයේ ලංකාව බෙදා තිබූ දේශපාලන බෙදීම් ය. එහි සීතාවක රාජධානිය දක්වා ඇති අක්ෂරය කුමක් ද? (ලකුණු 2)

(iv) වන්නි පාලන ප්‍රදේශ සේයා කර ඇත්තේ කුමන අක්ෂරය මගින් ද? (ලකුණු 2)



(v) පින්තූරයේ දැක්වෙන තැනැත්තා කවුද ඔහු කුමන ජාතිකයෙක් ද? (ලකුණු 2)

(vi) ඔහු සොයාගත් සමුද්‍ර සන්ධිය කුමක් ද? (ලකුණු 2)



(vii) මෙම පින්තූරයේ දැක්වෙන නටඹුන් වලින් පෙන්නුම් කරන කෝවිල නම් කරන්න. (ලකුණු 2)

(viii) එය ඉදි කළේ කුමන රාජධානි සමයේ ද? (ලකුණු 2)

(ලකුණු 2 X 8 = 16)

(02) (i) ජල තාක්ෂණය ආශ්‍රිතව ඇති ශිල්ප ක්‍රම යොදා ගෙන කළ නිර්මාණ 3ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) අතීත රජවරු නිර්මාණය කළ වැව් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වැවේ වර්තමාන නම | ඉදි කළ රජු | වැව හඳුන්වා තිබූ පැරණි නම |
|---|---|---|
| බසවක්කුලම | A _________ | අභයවාපී |
| මහ විලච්චිය වැව | වසභ රජු | B _________ |
| C _________ | මහසෙන් රජු | ජල්ලූර වාපී |
| මඩාටුගම වැව | D _________ | මහාදන්තවාපී |

(ලකුණු 4)

(iii) පහත පින්තූරවලින් දක්වා ඇති වැවෙහි අංග නම් කර එම අංගවලින් ලැබුණ ප්‍රයෝජන දක්වා වගුව සම්පූර්ණ කරන්න.

| වැවේ අංගය (පින්තූර මගින්) | අංගය නම් කිරීම | ප්‍රයෝජනය |
|---|---|---|
|  | (1) _________ | (2) _________ |
|  | (3) _________ | (4) _________ |

(ලකුණු 4)

(03) (i) පහත A, B, C ප්‍රකාශවලට අදාළ පිළිතුරු ඉදිරියෙන් ලියා දක්වන්න.

A - මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිතා කළ වෙනත් නමක් සඳහන් කරන්න.

B - පළමු වන රාජසිංහ රජුට උඩරට අත්පත් කර ගැනීමට උදවු කළ තැනැත්තා කවු ද?

C - පළමු වන විමලධර්මසූරිය රජු විසින් දළදා වහන්සේ උඩරටට වැඩම කරන තෙක් සඟවා තිබූ ස්ථානය

(ලකුණු 3)

(ii) උඩරට රාජධානියේ රජ කළ නායක්කර් වංශික රජවරු හතර දෙනා අනුපිළිවෙළින් නම් කරන්න.

(ලකුණු 4)

(iii) පහත සඳහන් වන්නේ උඩරට රාජධානියේ කෘෂිකර්මාන්තය සිදු වූ ආකාරය දක්වෙන ප්‍රකාශ කීපයකි. එම ප්‍රකාශ අදාළ පරිදි පහත සඳහන් වගුවට වගු ගත කරන්න.

A - හෙල්මළු ක්‍රමයට සකස් කළ බිම්වල වගා කිරීම.
B - කුරක්කන්, මෙනේරි, තල ඉරිඟු ආදිය වගා කිරීම.
C - කිරි ලබා ගැනීම.
D - කොස්, දෙල්, අල වර්ග වගා කිරීම.
E - ප්‍රවාහනයට යොදා ගැනීම.
F - සාදික්කා, ගම්මිරිස්, කරඳමුංගු, පුවක් වගා කිරීම.
G - ගොවිතැන් සඳහා යෙදීම.
H - අහස් දියෙන් වගා කිරීම.

| කුඹුරු ගොවිතැන | හේන් ගොවිතැන | ගෙවතු වගාව | සත්ව පාලනය |
|---|---|---|---|
| | | | |

ලකුණු 1/2 බැගින් (ලකුණු 4)

(04) (i) පහත දක්වෙන පින්තූරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A - මෙම චිත්‍රය හඳුනාගෙන නම් කරන්න.

B - එය නිර්මාණය කළේ කවු ද?

C - ඔහු කුමන ජාතිකයෙක් ද? (ලකුණු 3)

(ii) පුනරුද සමයේ නව සොයා ගැනීම් හා නිර්මාණවලට අදාළ ව පහතු වගුව සම්පූර්ණ කරන්න.

| සොයා ගැනීම /නිර්මාණය | සොයා ගැනීම / නිර්මාණය කළ තැනැත්තා |
|---|---|
| 1. පෘථිවිය හා අනෙකුත් ග්‍රහ වස්තු සූර්යයා වටා ගමන් කරන බව | 1. .......................... |
| 2. අවසාන විනිශ්චය චිත්‍රය | 2. .......................... |
| 3. දුරේක්ෂය | 3. .......................... |
| 4. ග්‍රහලෝක සියල්ලම ඉලිප්සාකාරව සූර්යයා වටා ගමන් කරන බව | 4. .......................... |

(ලකුණු 4)

(iii) පුනරුදයට පෙර හා පසු කාලවල කලා ශිල්පවල සිදු වූ වෙනස්කම් ඇසුරෙන් පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| A පුනරුද සමයට පෙර කලා ශිල්ප | B පුනරුද සමයේ කලා ශිල්ප |
|---|---|
| 1. ආගමික මුහුණුවරක් ගැනීම. | a. ........................................................................ |
| 2. ........................................................................ | b. විවිධ ධනවතුන් අනුග්‍රහය දැක්වීම. |
| 3. ස්වාධීන නිර්මාණවලට ඉඩක් නොවීම. | c. ........................................................................ |
| 4. ........................................................................ | d. රස වින්දනය ඇති කිරීම මූලික පරමාර්ථය වීම |

(ලකුණු 4)

(05) (i) යුරෝපයේ මධ්‍යධරණී මුහුද ආශ්‍රිතව බිහි වූ ප්‍රසිද්ධ වෙළෙඳ නගර තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) දේශ ගවේෂණයේ යෙදුන පුද්ගලයන් දෙදෙනෙක් පහත වගුවේ දැක්වේ. ඔවුන්ගේ නම් හා ඔවුන් සොයා ගත් ප්‍රදේශ වරහන් තුළින් තෝරා වගුව පුරවන්න.

| දේශ ගවේෂකයාගේ පින්තූර | නම | සොයා ගත් ප්‍රදේශ |
|---|---|---|
|  | (1) .................. | (2) .................. |
|  | (3) .................. | (4) .................. |

(ලකුණු 4)

(වස්කෝදගාමා, පර්ඩිනන්ඩ් මැගලන්, ක්‍රිස්ටෝපර් කොලොම්බස්, කැලිකට්, ඉස්පැනියෝලාව, පීරු දේශය)

(iii) ආසියාවෙන් යුරෝපයට ගෙන ගිය භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ. ඒවා රැගෙන ගිය රටවල් නම් කරන්න.

(1) සේද රෙදි - (2) රිදී - (3) ඇත්දත් - (4) අබිං -

(ලකුණු 4)

(06) (i) ආසියාවට පැමිණි පහත දැක්වෙන යුරෝපා ජාතීන්ගේ මවු රටවල් පිලිවෙළින් නම් කරන්න.

1. පෘතුගීසින් - 2. ලන්දේසීන් - 3. ඉංග්‍රීසීන් - (ලකුණු 3)

(ii) පහත ABC හා D යටතේ අසා ඇති ප්‍රශ්නවලට ABCD අනුපිළිවෙළින් පිළිතුරු ලියන්න.

A - ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය පිහිටුවා ගත් ස්ථානය කුමක් ද?

B - පෘතුගීසීන් ශ්‍රී ලංකාව හැඳින්වූ නම කුමක් ද?

C - පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ යාපන රාජධානියේ පාලකයා වශයෙන් කටයුතු කළේ කවු ද?

D - vii වන බුවනෙකබාහු රජුගෙන් පසු කෝට්ටේ පාලකයා බවට පත් වූයේ කවු ද? (ලකුණු 4)

(iii) පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ පිළිබඳව තොරතුරු ඇතුළත් පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| උඩරට රජු | පෘතුගීසි හමුදාව මෙහෙය වූ තැනැත්තා | සටන සිදු වූ ස්ථානය |
|---|---|---|
| (1) ................................ | පේරෝ ලොපෙස් ද සූසා | දන්තුරේ |
| I වන විමලධර්මසූරිය රජතුමා | (2) ................................ | බලන |
| සෙනරත් රජු සටන මෙහෙයවීම<br>II වැනි රාජසිංහ රජු | කොන්ස්තන්තිනූ ද සා | (3) ................................ |
| II වැනි රාජසිංහ රජු | (4) ................................ | ගන්නොරුව |

(ලකුණු 4)

(07) (i) පෘතුගීසීන් විසින් මෙරට ඔවුන්ගේ පාලන ප්‍රදේශවල ආදායම් එකතු කිරීම සඳහා පත් කළ නිලධාරීන් තිදෙනකු පහත දැක්වෙන ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

* අතුකෝරාළ  * ලියන්නන්  * ප්‍රතිරාජයා


* කනකපුල්ලේ  * මහබද්දේ කපිතාන්  * මයෝරාළවරුන් (ලකුණු 3)

(ii) පෘතුගීසීන් යටතේ මෙරට ක්‍රියාත්මක වූ ආගමික නිකායන් හා භාර ප්‍රදේශවලට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න.

| භාර ප්‍රදේශ | නිකායට අදාළ පූජකවරු |
|---|---|
| 1. ............................ | ප්‍රැන්සිස්කන්වරු |
| සතර කෝරළය | 2. ....................................... |
| 3. ....................................... | ජෙසුයිට්වරු |
| සබරගමුව | 4. ....................................... |

(ලකුණු 4)

(iii) පෘතුගීසීන්ගෙන් මෙරට සංස්කෘතියට එකතු වූ නාවාංග පහත සටහනට අනුව සම්පූර්ණ කරන්න.




(ලකුණු 4)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

## ඉතිහාසය පිළිතුරු පත්‍රය

### I කොටස

(01) බිසෝකොටුව
(02) ශ්‍රී වික්‍රම රාජසිංහ
(03) තුර්කිජාතීන්
(04) පර්ඩිනන්ඩ් මැගලන්
(05) කෝට්ටේ
(06) 3
(07) x
(08) 3
(09) x
(10) 3
(11) තොපෂ
(12) ජෝතිය
(13) කේම්බ්‍රිජ්
(14) ප්‍රංශය
(15) මුල්ලේරියා
(16) ලෙන් විහාර
(17) රාජාධිරාජසිංහ රජතුමා
(18) ශාන්ත පීතර
(19) බතාවිය
(20) මල්වානේ

(ලකුණු 20 x 2 = 40)

### II කොටස

(01) (i) කුණාටු කුඩුව / සුබ පැතීමේ තුඩුව
(ii) පිලිපීන් දූපත් - B
(iii) A අක්ෂර
(iv) B අක්ෂර වලින්
(v) පර්ඩිනන්ඩ් මැගලන්, පාතුගීසි
(vi) මැගලන් සමුද්‍ර සන්ධිය
(vii) බැරැන්ඩි කෝවිල
(viii) සීතාවක රාජධානි සමයේ

(ලකුණු 2 x 8 = 16)

(02) (i) වැව්, ඇළ වේලි හා පොකුණු (ලකුණු 3)

(ii) A. පණ්ඩුකාභය B. මයෙත්
C. හුරුළු වැව D. ධාතුසේන (ලකුණු 4)

(iii) 1. රළපනාව 2. වැව් බැම්ම සේදී යාම වැළැක්වීම.
3. පිටවාන 4. වැවේ අතිරික්ත ජලය පිට කිරීමට (ලකුණු 4)

(03) (i) A. සෙංකඩගල පුරය / උඩරට / උඩරට රජධානිය / කන්දෙනුවර
B. වීරසුන්දර බණ්ඩාර
D. දෙල්ගමු විහාරයේ කුරහන් ගලක් යට (ලකුණු 3)

(ii) 1. ශ්‍රී විජය රාජසිංහ රජතුමා 2. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
3. රාජා ධි රාජසිංහ රජතුමා 4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (ලකුණු 4)

(iii) කුඹුරු ගොවිතැන - A, H (ලකුණු 1/2 + 1/2) හේන් ගොවිතැන - B (ලකුණු 1/2)
ගෙවතු වගාව - D, F (ලකුණු 1/2 + 1/2) සත්ව පාලනය - C, E, G (ලකුණු 1/2 + 1/2+ 1/2)
ලකුණු 1/2 බැගින් (ලකුණු 4)

(04) (ii) A - මොනාලිසා

B - ලියනාඩෝ ඩාවින්චි

C - ඉතාලි ජාතිකයෙකි.

(ii) 1. නිකලස් කොපර්නිකස් 2. මයිකල් ආන්ජිලෝ

3. ගැලීලියෝ ගැලිලි 4. ජොහැන්නස් කෙප්ලර් (ලකුණු 4)

(iii) 1. ලෞකිකත්වයට මුල් තැන ලැබීම.

2. පල්ලියේ අනුග්‍රහය ලැබීම.

3. ස්වාධීනව තම දක්ෂතා අනුව නිර්මාණය කිරීම.

4. ආගමික භක්තිය ජනිත කිරීම මූලික අරමුණු වීම. (ලකුණු 4)

(05) (i) ජිනෝවා, අලෙක්සැන්ඩ්‍රියාව, වැනීසිය

කොන්ස්තන්තිනෝපල් (ලකුණු 3) තුනක් දැක්වීමට

(ii) 1. වස්කෝද ගාමා 2. කැලිකට්

3. ක්‍රිස්ටෝපර් කොලොම්බස් 3. ඉස්පැනියෝලාව (ලකුණු 4)

(iii) 1. චීනය 2. ජපානය

3. ශ්‍රී ලංකාව 4. ඉන්දියාව (ලකුණු 4)

(06) (i) 1. පෘතුගාලය 2. ඕලන්දය 3. එංගලන්තය (ලකුණු 3)

(ii) A - බාතාවිය B - සෙයිලන් C - පරරාජසේකරම් D - ධර්මපාල කුමරු (ලකුණු 4)

(iii) 1. - I වන විමලධර්ම සූරිය 2. - දොන් ජෙරනිමෝ ද අසවේදු

2. - රන්දෙණිවෙල 4. - දියෝගෝ ද මෙලෝ (ලකුණු 4)

(07) (i) කනකපුල්ලේ, ලියන්නන්, මයෝරාළවරු (ලකුණු 3)

(ii) 1. මාතර 2. ඔගස්ටිනියන්වරු 3. සත් කෝරළය 4. ඩොමිනියන්වරු (ලකුණු 4)

(iii) ඇඳුම් - කමිස, සාය, කබාකුරුත්තු, කලිසම

ආහාර - පාන්, වයින්, සලාද , අච්චාරු, කොස්, දෝසි, පිපිඥ්ඤා, බතල, කජු

සංගීතය - බයිලා, කපිරිඥ්ඤා

පුද්ගල නම් - කැතරින්, ජෝන්, සිල්වා, පෙරේරා, අල්මේදා, අපොන්සු, මිගෙල් (ලකුණු 4)